# නාට්සිවාදයේ ගොදුර හෙවත්
# "සුදු රෝස" ව්‍යාපාරය



"...මා මේ ඉන්නා තැනට ඊළඟට එන්නේ ඔබ ය...."

තම මරණ සහතිකය ලියා ගත් සොෆී අධිකරණය හමුවේ පැවසූ අවසන් වදන් පෙළ ය ඒ. මරණ දණ්ඩණය නියම ව තම දෙමව්පියන්ගෙන් සමුගන්නා සොෆී ලෝක ඉතිහාසයෙ හි අලුත් පිටුවක් පෙරලුවා ය. ඇය මෙන්ම මරණ දණ්ඩණය හිමි කරගත් ඇගේ සොයුරු, හන්ස් සහ මිත්‍රයා, ප්‍රෝබ්ස්ට් වෙතින් වෙන්ව පෝරකයට ගෙන යන අවසාන මොහොතේ දී පවා ඇය කෙතරම් අභීත ව, නොබියව ඊට මුහුණ දුන්නා දැයි ඉතිහාසය විසින් සාක්ෂි දරයි.

ඒ මොහොතෙහි ඉර පායා දිලෙන්නට විය. දැඩි ආත්ම ශක්තියකින් යුතුව ඇය පියවර තබයි. පායා දිදුළන ඉරට හිනැහෙමින් තම සොයුරා සහ මිතුරා දෙස ආපසු හැරී බලයි. දෙපස ආරක්ෂක නිළධාරීහු ඈ පෝරකය වෙත ඇද යමින් සිටිති.

- ...ඉර පායලා... (ලස්සනට ඉර පායලා..) ..."

කඳුළු සඟවා ගනිමින් ඔවුන් දෙස බලා ඇය පැවසුවා ය. ඒ වසර 22 ක් තරම් වූ ඇගේ කෙටි ජීවිතයේ අවසාන වදන් ය. තාරුණ්‍යයේ ජවයත්, එඩිතරකමත් එම දෑස් තුළ මොනවට මතු වී තිබුණි.

*********

සොෆී මග්දලේනා ෂොල්, 1921 මැයි මස 09 දා ජර්මනියෙහි, ෆෝර්ෂ්ටන්බෙයර්ග් (Forchtenberg) හි උපත ලද අතර, සහෝදර සහෝදරියන් තිදෙනකුගෙන් යුත් පවුලක තම දෙමව්පියන් සමඟ 1930 වනතුරු එහි ජීවත් වූවාය. අනතුරුව ලුඩ්විග්ස්බර්ග් (Ludwigsburg) නගරයේත්, වසර දෙකකට අනතුරුව උල්ම් (Ulm) නම් නගරයේත් පදිංචිව සිටියාය.



*සරසවිය තුළ සුදු රෝස පත්‍රිකා බෙදා හැරීමේදී ඉහළ මාලයේ සිට ඒවා විසිරී ගිය අයුරු හුවා දැක්වීම සඳහා මියුනිච් සරසවි පිවිසුම ඉදිරියේ පොළොවෙහි තනා ඇති සිහිවටන*

මේ වන විටත් තම සොහොයුරු හන්ස් ෂොල් ජාතික සමාජවාදී පෙරමුණට සම්බන්ධව සිටි අතර සොෆී ද, ජර්මන් යෞවනියන්ගේ සංගමයට සම්බන්ධව සිටියාය.

1942 දී, ඇය මියුනිච් නගරයට පැමිණ ජීව විද්‍යාව සහ දර්ශනය හදාරන්නට පටන් ගත් අතර, ඇගේ සොහොයුරා මියුනිච්, ලුඩ්විග් මැක්සිමිලියන්ස් සරසවියෙහි වෛද්‍ය විද්‍යාව හදාරමින් සිටියේය. මෙම කාලයේ දී ඈ ඔහුගේ හිතමිතුරන් ද දැන හඳුනා ගත් අතර, පොදු පරමාදර්ශයන් වෙනුවෙන් සහ එවකට පැවති නාට්සිවාදයට විරුද්ධව ඔවුන් ගෙන ගිය රහසිගත දේශපාලනයට ද සෘජුව සහායෝගයක් නොදුන්න ද ඒ පිළිබඳ සියලු තොරතුරු සහ සැළසුම් දැන සිටියාය.

1943 පෙබරවාරි 18 වන දින මෙම රහසිගත සංවිධානය විසින් ක්‍රියාත්මක කරන්නට සූදානම් කර තිබූ සුදු රෝස පත්‍රිකා බෙදා හැරීමේ දැවැන්ත ව්‍යාපාරයේ ප්‍රධාන කොටස්කාරියක වන ඇය, එදින මියුනිච් සරසවිය පුරා සුදු රෝස පත්‍රිකා බෙදා හැරීමට හන්ස් සමඟ පිට වෙයි. **(කිසිවකුගේ හෝ ඇසට හසු නොවන පරිදි නාට්සිවාදීන්ට විරුද්ධව සකස් කරන ලද තොරතුරු පත්‍රිකා සරසවිය තුළ බෙදා හැරීමේ උභතෝකෝටික ප්‍රශ්නය හමුවේ සොෆී මග්දලේනා ඒ සඳහා ඉදිරිපත් වූවා ය.)**

අවාසනාවකි. විශ්ව විද්‍යාලයය තුළ ඒ මොහොතෙහි සිටි රාජ්‍යපාක්ෂිකයකුගේ දෑසට මොවුන් හසු වෙයි. ඔහු විසින් සපයන ලද ඔත්තුවට අනුව රාජ්‍ය යුද විරෝධී කණ්ඩායමේ සාමාජිකයින් ලෙස අත්අඩංගුවට පත් වන සොෆී සහ හන්ස් බන්ධනාගාර ගතකර තබයි. **විවිධ කටුක අත්දැකීම් වලට මුහුණ දුන්න ද කිසිවකු හෝ පාවා නොදී ඔවුහු වරද බාර ගනිති. මිනිස් සංහාරයට විරුද්ධ වීමත්, සමාජ සාධාරණයත් වෙනුවෙන් තම ජීවිත පුද දෙති.** අනේක වාරයක් ප්‍රශ්න කිරීම් සහ සාකච්ඡාවන්ට මුහුණ දුන් සොෆී සැබැවින්ම වරදකාරියක නොවන මුත් ඇය කිසිවකු පාවා නොදී අන් අය බේරා ගැනීමේ පරම චේතනාවෙන් යුතුව මරණය බාර ගත් වීරවරියක වූවා ය.



*සොෆි ෂොල් සහ සුදු රෝස පත්‍රිකා ව්‍යාපාරය සැමරීමට මියුනිච් සරසවිය තුළ පිහිටුවා ඇති සිහිවටන ඵලකය*

*******

සුදු රෝස පත්‍රිකා යනු අවිහිංසාවාදී වූත්, නාට්සි විරෝධී වූත් ව්‍යාපාරයකි. ජර්මනියේ මියුනිච් සරසවියෙහි දර්ශනය පිළිබඳ ජර්මන් ජාතික මහාචාර්යවරයකු සහ එහි ජර්මන් ජාතික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රයත්නයක් වූ මෙම ව්‍යාපාරය නාට්සි මර්ධන යන්ත්‍රය විසින් සාහසික ලෙස සහමුලින් ම විනාශ කරන ලදී.

සොෆී මග්දලේනා ෂොල් 1943 පෙබරවාරි 22 දා රාජ්‍ය ද්‍රෝහී චෝදනා යටතේ ගිලටීනගත කොට ඝාතනය කරන ලදී.

පසුකාලයේ දී මියුනිච් සරසවිය තුළ ඔවුනගේ ස්මාරක තනා ඇති අතර වත්මනෙහි ඇය ජර්මනියෙහි වීරවරියක ලෙසින් පුදනු ලබයි. මේ වන විට මුළු ලොවම නාට්සිවාදය ප්‍රතික්ෂේප කරයි. එතරම් මුග්ධ සහ දරුණු අපරාධයක් ඉවසා සිටින්නට කාට නම් හැකි වේද?

*"The Final Days" යනු සිනමාවට නැගූ සොෆීගේ කතාවයි.*
*තිර රචනය: Fred Breinersdorfer,*
*අධ්‍යක්ෂණය: Marc Rothemund,*
*නිෂ්පාදනය: Fred Breinersdorfer & Team,*
*සංගීතය: Reinhold Heil, Johnny Klimek,*
*රඟපෑම්: Julia Jentsch, Farbian Hinrichs*

**තුෂාරි ප්‍රියංගිකා**

## "White Rose"
## සුදු රෝස මල.

ආධිපත්‍යයට යට වූ
නිදහස වෙනුවෙන්
මරණය වැළඳගත්
තාරුණ්‍යය..

නරුම ඉතිහාසයකට
නටඹුන් ව
බෙදා දුන්
සුදු රෝස පත්‍රිකාවක
ලියා තැබූ නිදහස..

මියුනිච් පුරවර අරා වැජඹෙන
සරසවි බිම තුළ
සුදු රෝස පත් විසිරුවා
අලුත් ඉතිහාසය ලියන්නට
අලුත් කොළයක
මුල පිරූ තුමුල ගිරි හිස් ය.

ජීවිතේ අවසාන මොහොතේ
සිපිරි ගෙයි ඇති
අඳුරු කුටියක
තැබූ ඒ
නැවුම් මල් කැකුළ,

සුදු රෝස මල ඇය ය
පරණ ඉතිහාස පොතෙ
අලුත් පිටුවක් ලිවූ

යළි කිසිදාක
කිසිවකුම හෝ
ලියා දැයි සැක සිතෙන

මිනිසා ට අවැසි
පරම පවිත්‍ර වූ
නිදහස වෙනුවෙන්
සුදු රෝස කුසුම
මිළින විය

ජීවිතේ ලංසුවට
තැබූ මරණය
රහසේ හැඬූ කඳුළඟ රැඳවිණ.

මිනිසාගේ නිදහස ම අතුරා
වනසා දමන්නට සතුරා
දිවි පිදූ නැවුම් මල් කැකුළ,

සුදු රෝස මල ඇය ය
කර්කශ මිනිසුන් අභියස නොසැලුණ,

-තුෂාරි ප්‍රියංගිකා-




